

# ලස්සන සමනලයා

යෙනුලි ගාල්ලගේ

# ලස්සන සමනලයා

යෙනුලි යෙහන්සා ගාල්ලගේ
කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය-2025

ISBN 978-624-208-227-1



# පිදුම

මේ පොත  ලිවීමට මාව දිරිමත් කල අම්මට,
තාත්තට,ලොකු අත්තට හා අත්තම්මටත්,මගේ
වැරදි අඩුපාඩු සකස් කර දුන් දිල්ක්රුෂි ඊශ්වරගේ
ගුරු මැණියන්ටත්,මට හැම විටම උදවු කරන
මගේ අක්කා ජෙනුලිටත් මගේ හදපිරි ප්‍රණාමය!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යම වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එකමත් එක දවසක ලස්සන සමනලයෙක් හිටියා.

ඒ ලස්සන සමනලයාගේ පියාපත් පාට පාටයි,හරිම ලස්සනයි.

එදත් උදේම නැඟිටලා මෙයා සෙල්ලම් කරන්න ගියා.

ඉතිං මේ චූටි සමනලයා උදේ ඉඳන් දවල් වෙනකන්ම හොඳට සෙල්ලම් කලා.




ඔන්න ටිකකින් සමනලයගේ බඩෙන් පොඩි සද්දයක් ඇහෙන්න ගත්තා.

“ම්...මේ මොකද?” සමනලයා හිතුවා.

“හානේ! දැන්නේ මට මතක් වුණේ,අම්මා දීපු උදේ කැම බීලා එන්න බැරි වුණා කියලා .”

“දැන්නම් හොඳටම බඩගිනියි මට”

ඉතිං ,එහෙම කියලා සමනලයා පැණි බොන්න මලක් සොයාගෙන ගියා.



පැණි ගොඩක් බොන්න පුලුවන් නිසා සමනලයා මල් ගොඩාක් තියෙන රෝසි ආච්චිගේ මල් වත්තට ආවා.

ඒකේ ලස්සන පොකුණකුත් තියෙන නිසා රෝසි ආච්චිගේ මල් වත්තට සමනලයා හරිම කැමතියි.

“ෂා.....හරිම ලස්සනයි!, ම්...ම්.. ඒ වගේම හරිම සුවඳයි!”

“අද නම් රෝසි ආච්චිගේ වත්තේ මල් ගොඩායි...”

සමනලයගේ බඩගින්න තවත් වැඩි වුණා.



“හැම පාට මලකින්ම පැණි ටික ටික බීලා බලමු”

“පුදුම රසක්නෙ මේ මල් පැණිවල තියෙන්නේ, අම්මටත් කියන්න ඕනේ, මීට පස්සේ රෝසි ආච්චිගේ වත්තෙන් ගෙදරට මල්පැණි ගේන්න කියලා”

සමනලයා වත්තෙ තිබුණු මල් වලින් හොඳට පැණි බිව්වා.

“හරිම රසයි.... පොකුණ පැත්තෙත් ගිහින් බලන්න ඕනේ” සමනලයා හිතුවා.

සමනලයා පොකුණ පැත්තට පියාඹලා ගියා.



පොකුණේ වතුර නිල්ම නිල් පාටයි.ලස්සන ලස්සන නෙළුම් මල් වලින් පොකුණ පිරිලා.

සමනලයා පොකුණේ තිබුණු ලස්සන නෙළුම් මලක් දැක්කා.

සමනලයාට හරිම සතුටුයි, පොකුණේ තිබුණු ඒ ලස්සන මල දැකලා.

“අනේ!මෙච්චර ලස්සන මලක් මම දැක්කමයි”

සමනලයා මලෙන් පැණි බිව්වා.

“ මේ පැණි හරිම රසයි” සමනලයා කිව්වා. ඒ නිසා සමනලයා ගොඩාක් වෙලා මලෙන් පැණි බිව්වා.



හොඳට පැණි බිබී හිටිය සමනලයගේ බඩ ටිකක් රිදෙනවා වගේ දැනුණා.

එන්න ,එන්නම බඩ රිදෙන එක වැඩි වුණා.

"අනේ! මගේ බඩ ඌයි...ඌයි රිදෙනවා!" සමනලයා කෑ ගැහුවා.

ඉතිං ලස්සන සමනලයා දොස්තර මහත්තයා ළඟට ගියා.

"අනේ දොස්තර මහත්තයෝ මගෙ බඩ හොඳටම රිදෙනවා" කියලා සමනලයා කිව්වා.

"කෝ බලමු" දොස්තර මහත්තයා කිව්වා.



“ඔයා අද මල් පැණි ගොඩක් බිව්වද? දොස්තර මහත්තයා ඇහුවා.

“ඔව්,ගොඩක් බිව්වා.” සමනලයා කිව්වා.

“ආ... ඒකනේ මේ බඩ රිදෙන්නේ,ආයේ නම් මල් පැණි ගොඩක් බොන්න එපා හොඳේ ” දොස්තර මහත්තයා කිව්වා.

ඉතිං එදා ලස්සන සමනලයා හොඳ පාඩමක් ඉගෙන ගත්තා. ඒ තමයි ,

මල් පැණි ගොඩක් බොන්න එපා, ටිකක් බිව්වම ඇති කියලා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනඟා දී තිබේ තම නිසඟ,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනවිරත්න මහලේකම්

ISBN-978-624-208-227-1